Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- පෙරදිග සංගීත

සතිය - 11

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# බටහිර සංගීතය

- ## scale නිර්මාණය

<u>මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් Minor scale එකක් නිර්මාණය කරමු</u>

පෙර නිර්මාණය කළ major scale එකට වඩා minor scale එකේ ස්වර අතර පරතරය වෙනස් වේ

## Minor scale එකක ස්වර පරතරය

1 වන ස්වරය 2 වන ස්වරය 3 වන ස්වරය 4 වන ස්වරය 5 වන ස්වරය 6 වන ස්වරය 7 වන ස්වරය 8 වන ස්වරය

TONE SEMI TONE TONE TONE SEMI TONE TONE TONE

**උදාහරණ**

C $C^{\#}$ D $E^{b}$ E F $F^{\#}$ G $A^{b}$ A $B^{b}$ B C

TONE SEMI TONE TONE TONE SEMI TONE TONE TONE

C D $E^{b}$ F G $A^{b}$ $B^{b}$ C

මේ අනුව ඉහත නිර්මාණය කර ඇත්තේ **C** minor scale එකයි

**Minor scale** එකක් පහසුවෙන් අංක යොදා ගනිමින් සකස් කරන ආකාරය පහත දක්වා ඇත

අපිට minor scale එකක් වාදනය හෝ ගායනය කරන විට ශුද්ධ ස්වර පමණක් යෙදෙන එක් scale එකක් ඇත එය A minor scale එකයි A ස්වරයේ සිට ස්වර හතක් ශුද්ධ ස්වර ලෙස වාදනය කළ විට ලැබෙන්නේ A minor scale එකයි

- එය සෑදෙන ආකාරය අපි බලමු

  - මුලින්ම A ස්වරයේ 12 පිළිවෙලින් ලියා ලියාගන්න

A $B^{b}$ B C $C^{\#}$ D $E^{b}$ E F $F^{\#}$ G $A^{b}$

- දෙවනුව A ස්වරය 1 කර කරගනිමින් පිළිවෙලින් අංක 12 යොදන්න

| A | $B^b$ | B | C | $C^\#$ | D | $E^b$ | E | F | $F^\#$ | G | $A^b$ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |

- දැන් එම scale ඇති ශුද්ධ ස්වර යන්ට අදාල අංක සලකුණු කරගන්න

| A | $B^b$ | B | C | $C^\#$ | D | $E^b$ | E | F | $F^\#$ | G | $A^b$ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (3) | (4) | 5 | (6) | 7 | (8) | (9) | 10 | (11) | 12 |

**A B C D E F G**

එසේ සලකුණු කර ගත් අංක වලට අදාළ ස්වර පිළිවෙලින් ලියූ විට අපට ලැබෙනුයේ A minor scale එකයි

මෙසේ සොයාගත් අංක භාවිතා කරමින් අපිට Minor scale නිර්මාණය කර ගත් හැකිය

# උදාහරණ

D minor scale එක නිර්මාණය කරමු

පළමුව C ස්වරයේ සිට ස්වර දොළස පිළිවෙලින් ලියන්න

C $C^{\#}$ D $E^{b}$ F $F^{\#}$ G $A^{b}$ A $B^{b}$ B

දෙවනුව D ස්වරය මූලික ස්වරය කරගනිමින් එය අංක එක යොදා පිළිවෙළින් ස්වර දොළස යොදන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

මුලින් සොයාගත් A minor scale එකට අදාල අංක මෙහි සලකුණු කරගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| **11** | 12 | **1** | 2 | **3** | **4** | 5 | **6** | 7 | **8** | **9** | 10 |

D E F G A $B^{b}$ C

දැන් ඔබට ලැබෙනුයේ D minor scale එකට අදාල ස්වර සප්තකය වේ

**<u>පැවරුම්</u>**

1 E minor scale එක නිර්මාණය කරන්න

2 පංචමය ශ්‍රැති ස්වරය කරගනිමින් G minor scale එක නිර්මාණය කරන්න

3 මධ්‍යමය ශ්‍රැති ස්වරය කරගනිමින් F minor scale එක නිර්මාණය කරන්න

4 කෝමළ නිශාදය ශ්‍රැති ස්වරය කරගනිමින් $B^b$ minor scale එක නිර්මාණය කරන්න